

# හා පැංචා ගමන ගියපු හැටි

පිතුමි ධනාරා

## පෙරවදන

පුන්චි මගේ හැකියාවන් බබළවන්න, මට මේ පොත ලියාගන්න, උදව් කරපු හැම කෙනාට , තුති වෙම් මම හද පතුලෙන්



එකෝමත් එක කාලෙක හා පැංචෙක් හිටියා.

මේ හා පැංචා දවසක් හිතුවා ගමනක් යන්න.

දැන් ගමන යන්න හා පැංචා මල්ලකට කෑම,
වතුර, ලේන්සු, ටිකකුත් දා ගත්තා.

දැන් ගමන යන්න පටන් ගත්තා.

ටික දුරක් යන විට හා පැංචාට මහන්සියක් දැනුනා. ඉතින් හා පැංචා ගහක් යටට වෙලා උඳු පියලිය කාලා නිදා ගත්තා.

බඩගින්නේ යන නරි රාල හා පැංචාගේ මල්ලේ කෑම වරිග ගොඩාක් තියනවා දැක්කා. නරි රාල මල්ල ගත්තා. එයාගෙ ගුහාවට ගියා. එයා මල්ලේ තියන ඔක්කොම කෑම කෑවා.






“දැන්නම් හොදටම බඩ පිරිලා මම ටිකක් නිදා ගන්නවා”

නරි රාල කීවා.

හා පැංචාට ඇහැරුනා.

"අනේ මගේ මල්ල"

හා පැංචා කලබලයෙන් කෑ ගැහුවා.





ඒ ශබ්දය ඇහිලා නරි රාලට ඇහැරුනා.

අනේ මොකක්ද ඒ ශබ්දය?

නරි රාල කීවා.

හා පැංචා දැක්කා අඩි පාරවල් බිම තියනවා.

මේවා නරි රාලගෙ තමයි. එයා වෙන්න ඇති
මගේ මල්ල ගන්න ඇත්තේ. මම මේ අඩි
පාරවල් දිගේ යන්නම් කියලා හා පැංචා කීවා.





“මොනවද ඔයා කලේ ඔය”

නරි රාල දුවගෙන කාමරයට ගියා.

“ඔයා ආය කවදාවත් ඔයාට අයිති නැති දෙයක් ගන්න එපා”

හා පැංචා කාමරයේ ජනේලය ලගට ගිහින් කීවා.
නරි රාල හා පැංචාට මල්ල දීලා සමාව ඉල්ලුවා.
“මම ඔයාට සමාව දෙනවා”

හා පැංචා කිවා.

පුංචි ඔයාලනම් එහෙම කරන්න එපා.

සමාව දෙන්නත්, වැරදි නොකර ඉන්නත් පුරුදු වෙන්න ඕන.



**පසුවදන**

කියවාලා කතන්දරේ, පුරවාලා ආදරේ, සහයෝගය දෙන්න
ඔබේ , පුන්චි මගේ අනාගතේ මංපෙත් එලිකර


සිතුමි ධනාරා